# Learning Management System
# LMS

## ශිෂ්‍ය උපකාරක මාර්ගෝපදේශය

Distance and Continuing Education Unit,
University of Ruhuna



# හැදින්වීම

**Moodle** යනු අතථ්‍ය ඉගෙනුම් පරිසරයකි (**Virtual Learning Environment**). එය ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (**LMS**) වන අතර ඉගැන්වීම් හා ඉගෙනුම් ආධාරක හා ක්‍රියාකාරකම් ලබා දීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති වෙබ් අඩවියකි.

# LMS වෙත ප්‍රවේශ වීම




1. ප්‍රථමයෙන් පහත වෙබ් ලිපිනය හරහා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය LMS ඇතුල්විය හැක. පද්ධතියට ඇතුලු වූ පසු ඉහත රූපයේ ආකාරයෙන් දිස් වේ.
   http://dceu.ruh.ac.lk/vle/

2. තවද, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ වෙබ් අඩවිය හරහා ද LMS ඇතුල්විය හැක




3. පසුව Site News වෙත අවධානය යොමු කරන්න. එහි මෙම වෙබ් අඩවිය සඳහා අවශ්‍ය තොරතුරු ඇතුලත්ය. (රූපයේ අංක 1)

4. පසුව Login මත Click කරන්න (රූපයේ අංක 2). එය පහත රූපයේ ආකරයෙන් දිස් වේ.



5. පද්ධතියට ඇතුලු වීම සඳහා Username හා Password ඇතුලත් කල යුතුය. ඔබගේ username ආකෘතිය පහත ඇයුරු වේ.

**Username**

**eRegistartionYearRegistartionNumber**

**e** - සියලු ශිෂ්‍යයන් සඳහා පොදු වේ.

**RegistartionYear** - ලියාපදිංචි වූ වසර

(මෙය ශිෂ්‍ය වාර්තා පොතහි සඳහන් වසර වේ.)

**RegistartionNumber** - ලියාපදිංචි අංකය

උදා ▪ e201529111

**Password**

ප්‍රථමවර Login වීම සඳහා 123456 වේ

6. පසුව පද්ධතියට ඇතුවු පසු ඔබට, ඔබගේ මුරපදය(password) වෙනස් කල යුතුය. එය පහත රූපයේ ආකරයෙන් දිස් වේ.

7. සැයු ▪ ඔබට දෙවනවර සිට පද්ධතියට ඇතුලු වීම සඳහා ඔබගේ නව මුරපදය බාවිතා කළ යුතු බැවින් එය මතකයේ තබා ගත යුතුය


You must change your password to proceed.

Change password

Username testuser

The password must have at least 8 characters, at least 1 digit(s), at least 1 lower case letter(s), at least 1 upper case letter(s), at least 1 non-alphanumeric character(s)

Current password*

New password*

New password (again)*

Save changes

There are required fields in this form marked *.

8. මෙම පියවර සම්පූර්ණ කිරීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.
   Current Password ඔබ දැනට භාවිතා වන මුරපදයයි. (123456)
   New Password * ඔබගේ නව මුරපදය

නව මුරපදය තොරාගැනීමේදී අනිවාර්යයෙන් භාවිතා කලයුතු උපදෙස්

i. අකුරු 8කින් සමත් විය යුතුය
ii. එහි අඩුම තරමින් එක් අංකයක් ඇතුලත් විය යුතුය.
iii. එහි අඩුම තරමින් එක් සිම්පල් ඉංග්‍රීසි අක්ෂරයක් ඇතුලත් විය යුතුය.
iv. එහි අඩුම තරමින් අකුරු හෝ ඉලක්කම් නොවන අක්ෂරයක් ( උදා !@#$%^&*^() ) ඇතුලත් විය යුතුය.

9. පසුව මුරපදය නිවැරදිව අතුලත් කිරීමෙන් පසුව පහත රූපයේ ආකරයෙන් දිස් වේ. පසුව Continue මත Click කල යුතුය.



# LMS Navigation Options

පසුව, පහල රූපයේ දක්වා ඇති Navigation විකල්පයන් (Options) දෙස අවධානය යොමු කරන්න. එහි (Site Home) මගින් මුල් වෙබ් පිටුවද ඒ හරහා අදාල පාඨමාලා වෙතද යොමුවිය හැක.

එහි Courses යනු දැනට LMS හි පවතින පාඨමාලා වන අතර My Courses යනු ඔබ විසින් ලියපදිංචි වී (Enroll වී ඇති) පාඨමාලා වේ.

Dashboard මගින්ද ඔබ විසින් ලියපදිංචි වී (Enroll වී ඇති) පාඨමාලා වෙත යොමුවිය හැක.




# LMS ඉගෙනුම් ආධාරක ලබා ගැනීම.

ඉගෙනුම් ආධාරක ලබා ගැනීම් සඳහා ප්‍රථමයෙන් අදාල විෂය වෙත යොමු විය යුතුය. ඒ සඳහා පෙර විස්තර කල Navigation Option භාවිතා කල හැක. Site Home මත Click කිරීමෙන් පහත රූපයේ අයුරින් දිස් වන අතර, එහි Course Categories යටතේ විෂය අදාල මාතෘකාව, ආදාල විෂයය හා විභාගය අනුව තෝරාගත හැක.




උදහරණ ලෙස Course Categories යටතේ පහත විෂය අදාල මාතෘකාව තෝරා ගැනු ලැබුවේ නම්,

Geography / ► First Examination In Arts / ► මානව භූගෝල විද්‍යාව




පසුව අදාල විෂය අදාල මාතෘකාව නැවත පහත අයුරින් දිස් වේ




පසුව අදාල මාතෘකාව නැවත Click කල විට පහත අයුරින් ලියාපදිංචි අංකයක් (Self Enrolment Key) ලබා දීමට සිදුවේ

ඒ සඳහා “dceu” ලෙස type කර Enroll me මත Click කරන්න




පසුව ඔබ එම විෂය මාතෘකාවට අදාල දේශන පහත රූපයේ පරිදි පෙන්වනු ලැබේ



උදාහරණ ලෙස පලමු දේශනය මත Click කරනු ලැබුවේ නම් එයට අදාල ඉගෙනුම් ආධාරක පහත අයුරින් පෙන්වනු ලැබේ




උදාහරණ ලෙස එහි පළමු කොටස මත Click කිරීමෙන් පහත ලෙස ඊට අදාල විෂය කරුණු පැහැදිලි කළ Video නැරඹිය හැක




මෙලෙස ඔබට අනෙකුත් විෂයයන්ටද අදාල ඉගෙනුම් ආධාරකද ලබා ගත හැක

මෙම වෙබ් අඩවිය සඳහා පිවිසීමේදී හෝ ඉගෙනුම් ආධාරක මගින් දේශන දැක බලා ගැනීමේදී අපහසුතා ඇත්නම් පහත ඊමේල් ලිපිනය වෙත ඔබේ ගැටලුව යොමු කරන්න.
dceu@admin.ruh.ac.lk

# Zoom හැදින්වීම

Zoom යනු ශ්‍රව්‍ය හා / හෝ වීඩියෝ සම්මන්ත්‍රණ සඳහා බහුලව භාවිතා වන වෙබ් සම්මන්ත්‍රණ වේදිකාවකි (Web conferencing platform).

එය එකින් එක (one to one) හෝ කණ්ඩායම් ඇමතුම් සඳහා නිර්මාණය කර ඇති අතර පසුව බැලීමට සැසි (sessions) පටිගත කළ හැකිය.

# Zoom හරහා මාර්ගගත (Online) දේශන සඳහා සහභාගී වන ආකාරය.

ඔබට අදාල, දේශනයන්ට අදාල zoom invitation Link ( මෙමගින් ඔබට මාර්ගගත දේශන සඳහා සම්බන්ධ විය හැක) අදාල විෂය පත්‍රයහි පලකරනු ලැබේ. එය ලබා ගැනීම සඳහා LMS මගින් අදාල විෂය හා පත්‍ර නාමය වෙත යොමු විය යුතුය. එමගින් ඔබට අදාල zoom invitation Link ලබාගත හැකිය.  එය පහත ආකාර වේ.

https://learn.zoom.us/j/65338681024?pwd=cldXeC9sjYvU05nRC5SaWdhZz

එය මත click කල විට පහත අයුරින් දිස් වේ.



මෙහිදී ඔබට මාර්ගගත දේශන සඳහා සම්බන්ධ වියහැකි ආකාර <u>දෙකකි.</u>

1. මෙහිදී ඔබට අදාල මෘදුකාංගය භාගත(download) කොට ඔබගේ පරිඝණකට ස්ථාපනය (Install) කර බාවිතා කල හැක.

ඔබගේ පරිගණකයෙහි Zoom මෘදුකාංගය <u>**නැත්නම්**</u> පෙර දැක්වූ රූපයේ ඇති Download and run zoom මත click කරන්න. එය මත කල click කල පසු පහත අයුරින් දිස්වේ.

**සැ.යු. ඔබ භාවිතා කරන වෙබ් බ්‍රවුසරය(Web browser) මත පෙන්වන ආකාරය වෙනස් විය හැක.**




පසුව එය භාගත(download) කොට ඔබගේ පරිඝණකට ස්ථාපනය (Install) කල යුතුය. ඒ සඳහා Save මත Click කරන්න. පසුව එම භාගත කරගත් මෘදුකාංගය ස්ථාපනය (Install) කල යුතුය.

Zoom ස්ථාපනය (Install) වීම පහත ආකාරයෙන් දිස් වේ.



එය සම්පූර්ණ වූ පසු ඔබට ඔබගේ නම ඇතුලත් කිරීම සඳහා ඉඩ ලැබෙනු ඇත. එය ඇතුලත් කොට ඔබට මාර්ගගත දේශන සඳහා පිවිසිය හැක.

ඔබගේ පරිගණකයෙහි Zoom මෘදුකාංගය **ඇත්නම්** හෝ **වරක් ස්ථාපනය** (Install) කල විට zoom invitation Link මත click කල විට පහත අයුරින් දිස් විය හැක. (එය දිස්විය හැකි ආකාර දෙකක් පහත දක්වා ඇත.)







Open Link මත click කල විට ඔබට මාර්ගගත දේශන සඳහා පිවිසිය හැක.

2. නැතහොත් එය ඔබ භාවිතා කරන වෙබ් බ්‍රවුසරය(Web browser) හරහා වුවද මාර්ගගත දේශන සඳහා සම්බන්ධවිය හැක. (මෘදුකාංගය ස්ථාපනය (Install) අවශ්‍යය නොවේ.)

zoom invitation Link එය මත click කල විට පහත අයුරින් දිස් වේ.




පසුව launch meeting මත click කල විට පහත අයුරින් join from your browser ලෙස නව option එකක් ලැබේ.




එය මත click කල විට පහත අයුරින් දිස් වේ.




ඔබගේ නම ඇතුලත් කොට මාර්ගගත දේශනය සඳහා ඇතුලත් විය හැක.

# Zoom භාවිතය

හා සම්බන්ද වූ විට ප්‍රථමයෙන් පහත අයුරින් දිස් වේ. එහි Join with computer audio මත කරන්න.




පසුව, ඔබ මාර්ගගත දේශනය හා සම්බන්ද වූ විට පහත අයුරින් දිස්වේ.




මෙහිදී ඔබ මතකයේ තබාගත යුතු කරුණු කිහිපයක් ඇත.

1. දේශන සඳහා සහභාගි වීමේදී පහත රූපයේ දක්වා ඇති අයුරින් ඔබගේ මයික්‍රොපෝනය (microphone) නිශ්ශබ්ද(mute) කල යුතුය. එසේ නොකලහොත් ඔබගේ දේශනයේදී අනවශ්‍ය බාධා කිරීම් ඇතිවිය හැක.




ඔබට ආචාර්ය වරයා සමග කතා කිරීමට අවශ්‍යවේ නම් එය මත නැවත click කොට පහත ආකාරයට(Unmute) සකස් කල යුතුය.




2. එලෙසම ඔබගේ විඩියෝ දර්ශනයද විසන්ධි කල යුතුය.




3. තවද මෙහි, Chat හරහා පණිවුඩ හා තොරතුරු හුවමාරු කරගත හැක.

ඔබ ස්මාර්ට් ජංගම දුරකථනයක් භාවිතා කරන්නේ නම් එයට Zoom App එක ස්ථාපනය (Install) කරගත යුතුය. පසුව zoom invitation Link හරහා අදාල මාර්ගගත දේශන සඳහා සම්බන්ධවිය හැක.

මෙම වෙබ් අඩවිය සඳහා පිවිසීමේදී හෝ ඉගෙනුම් ආධාරක මගින් දේශන දැක බලා ගැනීමේදී අපහසුතා ඇත්නම් පහත ඊමේල් ලිපිනයට හෝ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත ඔබේ ගැටලුව යොමු කරන්න.

dceu@admin.ruh.ac.lk